# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 27 දරන ණය බේරුම් කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1975 ජූලි මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 අගෝස්තු මස 01 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 27 දරන ණය බේරුම් කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1975 ජූලි මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 28 බී/72.

ග්‍රාමීය ප්‍රදේශ තුළ ඇතැම් වර්ගවල ණය බේරුම් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 27 දරන ණය බේරුම් කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කෙටි නාමය.

**2.** (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන්නා වූ ද මේ පනතෙහි මින් මතු " නියමිත දිනය " යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද යම් දිනයක මේ පනත ක්‍රියාත්මක වන්නේ ය.

ඇතැම් සමගි මණ්ඩල ප්‍රදේශවල පනත ක්‍රියාත්මක වන බව.

(2) යම් මහා නගර සභාවක, නගර සභාවක හෝ සුළු නගර සභාවක පරිපාලන සීමාව ඇතුළත පිහිටි සමගි මණ්ඩල ප්‍රදේශයක් නොවන සෑම සමගි මණ්ඩල ප්‍රදේශයක් ම තුළ මේ පනත නියමිත දිනයෙහි සිට ක්‍රියාත්මක වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ " සමගි මණ්ඩල ප්‍රදේශය " යන්නට සමගි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

**3.** (1) 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, නියමිත දිනයට පෙර දරන ලද හෝ සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ආපසු ගෙවීමට ඇති හෝ ණයක් වෙනුවෙන් යම් ප්‍රමාණ කරන ලද මුදලක් අය විය යුතු සෑම ණයහිමියකු ම විසින්, මේ පනතේ විධිවිධාන අනුව ඒ ණය බේරුම් කර ගැනීම හෝ නිශ්චය කර ගැනීම සඳහා ඒ දිනයෙහි සිට මාස තුනක් ඇතුළත ණයකරු හෝ ණයකරුවන් අතුරින් කිසිවකු පදිංචිව සිටින්නේ යම් සමගි මණ්ඩල ප්‍රදේශයක් තුළ ද ඒ සමගි මණ්ඩල ප්‍රදේශයේ සමගි කරන්නන්ගේ මණ්ඩලයේ සභාපති වෙත නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් කළ යුතු ය.

සමගි කරන්නන් ගේ මණ්ඩලය වෙත ණයහිමියා විසින් කරනු ලබන ඉල්ලීම.

(2) මේ පනතේ කාර්යයන් සඳහා, ණයක් යන්නෙන් නියමිත දිනයට පෙර දරන ලද හෝ සම්පූර්ණයෙන් හෝ කොටසක් ආපසු ගෙවීමට ඇති හෝ ණයක් අදහස් වන අතර එයට රක්ෂිත හෝ රක්ෂිත නොවූ හෝ විනිමය බිල් පත්‍රයක්, පොරොන්දු නෝට්ටුවක්, චෙක්පතක්, උකසක්, නිශ්චල දේපළක පොරොන්දු සින්නක්කරයක්, වෙළෙඳ සැල් බිල් පත්‍රයක්, පොත් ණයක් හෝ වෙනත් ණයක් මත හෝ මගින් හෝ එක්ව හෝ වෙන් වෙන්ව එහෙත්, එක්ව සහ වෙන් වෙන්ව නොව දරන ලද යම් ණයක් ඇතුළත් වේ.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් නිශ්චල දේපළ පොරොන්දු සින්නක්කරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක—

(අ) දේපළ පවරනු ලැබුවේ, විකුණනු ලැබුවේ හෝ අන්සතු කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද එම තැනැත්තා ණය හිමි ලෙස සලකනු ලැබිය යුතු ය ; සහ ද

(ආ) දේපළ පැවරීම, විකිණීම හෝ අන්සතු කිරීම කරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද එම තැනැත්තා ණයකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් ණයකරුවකු—

(අ) නියමිත දිනයට පෙරාතුව ම වූ වර්ෂය තුළ යම් අවස්ථාවක යම් සමගි මණ්ඩල ප්‍රදේශයක් තුළ පදිංචිව සිට මේ පනතේ කාර්යයන් ව්‍යර්ථ කිරීම පිණිස ඒ ප්‍රදේශයෙහි පදිංචිය අත් හරින අවස්ථාවක ; හෝ

(ආ) සිටින ස්ථානය නොදන්නේ වුව ද, නියමිත දිනයට පෙරාතුව ම වූ වර්ෂය තුළ යම් අවස්ථාවක ඔහු යම් සමගි මණ්ඩල ප්‍රදේශ යක් තුළ අවසන් වරට පදිංචිව සිටි බව දන්නා අවස්ථාවක

(1) වන උපවගන්තියේ කාර්යයන් සඳහා ඔහු ඒ සමගි මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචිව සිටින ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) සමගි මණ්ඩල පනතේ 6 වන වගන්තිය යටතේ ණයහිමියකු විසින් නියමිත දිනයට පෙර සමගි මණ්ඩලයක් වෙත මේ පනත අදාළ වන යම් ණයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබ, එකී දිනයෙහි ඒ මණ්ඩලයේ සැලකිල්ලට භාජනව තිබෙන සෑම ඉල්ලීමක් ම (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමට අදාළ සියලු කාරණා වලදී මේ පනතේ විධිවිධාන අදාළ වන්නේ ය.

(6) මේ පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන සෑම ඉල්ලීමක් ම සමගි කරන්නන්ගේ මණ්ඩලයේ සභාපති විසින් ඒ මණ්ඩලයෙන් සංස්ථාපිත සමගි මණ්ඩලයක් වෙත බේරුම් කිරීම හෝ නිශ්චිත කිරීම සඳහා යොමු කළ යුතු ය.

(7) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ණය හිමියකු ඒ උප වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව ණයක් බේරුම් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පැහැර හරින අවස්ථාවක ඒ ණය අය කර ගැනීම හෝ බේරුම් කිරීම සඳහා—

(අ) යම් අධිකරණයක කිසිදු නඩුවක් පැවරීම හෝ යම් අධිකරණයක් විසින් නඩුවක් භාර ගැනීම හෝ නොකළ යුතු ය ;

(ආ) ණය සහනදායක මණ්ඩලය විසින් කිසිදු ඉල්ලීමක් භාර නොගත යුතු ය ; තව ද

(ඇ) සමගි මණ්ඩල පනතේ 6 වන වගන්තිය යටතේ සමගි කරන් නන්ගේ මණ්ඩලයක සභාපති විසින් කිසිදු ඉල්ලීමක් භාර නොගත යුතු ය ;

තව ද එවැනි ණය හිමියෙක් පොරොන්දු සින්නක්කරයක් මත නිශ්චල දේපළක පැවරුම්ලාභියකු වන අවස්ථාවක එම පැවරීම ශූන්‍ය හා බල රහිත වන්නේ ය.

(8) නියමිත දිනයෙහි පවතින ණයක් මත උද්ගත වී, ප්‍රමාණ කළ මුදලක් ගෙවීම සඳහා වූ බැඳීමක් සම්බන්ධයෙන් ඒ දිනයෙහි හෝ ඉන් පසුව කරනු ලබන යම් අලුත් කිරීමක් ශූන්‍ය හා බල රහිත වන්නේ ය.

(9) මේ පනතෙහි විධිවිධාන වංචනික ලෙස මග හරිමින්, (8) වන උපවගන්තියෙහි සඳහන් ණයක් මත උද්ගත වන බැඳීමක් අලුත් කිරීමට පාර්ශ්වකරුවකු වන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත් වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඔහු රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

ඇතැම් ඉල්ලීම් සම්බන්ධයෙන් මේ පනත අදාළ නොවිය යුතු බව.

4. මේ පනතෙහි විධිවිධාන—

(අ) 3(1) වන වගන්තියෙහි සඳහන් ණයක් මත යම් ප්‍රමාණ කරන ලද මුදලක් ලැබිය යුත්තේ යම් ණය හිමියකුට ද එම ණය හිමියා බැංකු ආයතනයක්, අනුමත ණය දෙන ආයතනයක්, හෝ මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් යෙදෙන යම් පුද්ගල මණ්ඩලයක්, (සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද) අනුමත අර්ථසාධක අරමුදලක්, රාජ්‍ය සංස්ථාවක් නැතහොත් රාජ්‍යය වන්නා වූ ; හෝ

(ආ) ඒ ණය සම්බන්ධයෙන් නියමිත දිනයට පෙර යම් අධිකරණයක නඩුවක් පවරා තිබෙන හෝ ණය සහනාදයක මණ්ඩලය වෙත ඉල්ලීමක් කර තිබෙන්නා වූ ; හෝ

(ඇ) ණය මුදල හෝ නියමිත දිනයෙහි දී ඉතිරිව තිබෙන ණය මුදල රුපියල් පන් දහසක් ඉක්මවන්නා වූ

අවස්ථාවක අදාළ නොවිය යුතු ය.

ඉල්ලීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී සමගි මණ්ඩලය සතු කාර්යයන්.

5. (1) මේ පනත යටතේ බේරුම් කිරීම සඳහා හෝ නිශ්චය කිරීම සඳහා සමගි මණ්ඩලයක් වෙත යම් ඉල්ලීමක් යොමු කරනු ලබන අවස්ථාවක, මණ්ඩලය ඉදිරියේ පෙනී සිටින ලෙස ඉල්ලීමෙහි නම් සඳහන් පාර්ශ්වකරුවන් කැඳවීම සහ සමාදාන බේරුමකට එළඹීම පිණිස පාර්ශ්ව කරුවන් පෙළඹවීමට මූලික විභාගයකින් පසුව සෑම උත්සාහයක් ම දැරීම මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

(2) සමාදාන බේරුමකට එළඹීමට පාර්ශ්වකරුවන් අපොහොසත් වන අවස්ථාවක, පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ලිඛිත සහ වාචික යන දෙවර්ගයේ ම සාක්ෂි සහ මණ්ඩලය අවශ්‍ය යයි කල්පනා කරන වෙනත් සාක්ෂි ලබා ගැනීමෙන් පසු එම ඉල්ලීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිශ්චයක් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිශ්චයක් කිරීමේ කාර්යය සඳහා අදාළ විය හැකි පහත සඳහන් කාරණා සියල්ල ම හෝ ඉන් කිසිවක් මණ්ඩලය විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකි ය :—

(අ) ණය හිමියාට ලැබිය යුතු මුල් මුදල ;

(ආ) ඒ මුදල හෝ ඒ මුදලෙහි කොටසක් ගෙවා ඇති අවස්ථාවක, ගෙවීමට ඉතිරිව ඇති මුදල හෝ නොගෙවා තිබෙන කාල පරිච්ඡේදය ;

(ඇ) අය කර ඇති පොලී ප්‍රමාණයේ සාධාරණත්වය ;

(ඈ) පොලී හෝ වෙනත් අය කිරීම් වශයෙන් හෝ මගින් දැනටමත් ගෙවා ඇති මුදල ;

(ඉ) තමාගෙන් අයවිය යුතු මුදල ගෙවීමට ණයකරුට ඇති ශක්තිය ;

(ඊ) ණය හිමියාගේ මුදල් තත්ත්වය ; සහ

(උ) සැලකිල්ලට ගත යුතු යයි මණ්ඩලය කල්පනා කරන වෙනත් එවැනි කාරණා.

(4) අවස්ථාවෝචිත පරිදි පාර්ශ්වකරුවන් අතර වූ බේරුම් කිරීමේ නියමයන්හි හෝ යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ මණ්ඩලයේ නිශ්චයෙහි—

(අ) තමාගේ හෝ තමන්ගේ බැඳීම් සම්පූර්ණයෙන් බේරුම් කර ගැනීමට ණයකරු හෝ ණයකරුවන් විසින් ණය හිමියාට ගෙවිය යුතු යම් මුදලක් හෝ මුදල් තිබේ නම්, ඒ මුදලේ හෝ මුදල්වල ප්‍රමාණය සහ එම මුදල හෝ මුදල් ගෙවිය යුතු වන දිනය සඳහන් විය යුතු ය ;

(ආ) එම මුදල වාරික මගින් ගෙවීමට ණයකරුට හෝ ණයකරුවන්ට අවසර දී ඇති අවස්ථාවක, එම වාරික ප්‍රමාණය සහ ඒ වාරික ගෙවිය යුතු දිනයන් සඳහන් විය යුතු ය ; තව ද

(ඇ) පාර්ශ්වකරුවන් අතර වූ බේරුම් කිරීමේ නියමයන් හෝ ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ මණ්ඩලයේ නිශ්චය, මණ්ඩලයේ සභාපති විසින් අත්සන් තබන ලද සහතිකයක දක්වා තිබිය යුතු අතර එම සහතිකයේ සහතික පිටපතක් එම ඉල්ලීමෙහි නම් කරන ලද එක් එක් පාර්ශ්වකරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ බේරුම් කිරීම හෝ නිශ්චය අනුව ගෙවිය යුතු යම් වාරිකයක් ගෙවීම පැහැර හරින ලද අවස්ථාවක, එම පැහැර හැරීම එම බේරුම් කිරීම හෝ නිශ්චය මත ගෙවිය යුතුව ඇති, එහෙත් නොගෙවා තිබෙන්නා වූ සම්පූර්ණ මුදල සම්බන්ධයෙන් කරනු ලබන පැහැර හැරීමක් ලෙස සැලකිය යුතු ය.

මණ්ඩලය විසින් බේරුම් කිරීමෙන් හෝ නිශ්චය කිරීමෙන් පසු ක්‍රියා පටිපාටිය.

**6.** (1) බේරුම් කිරීමේ නියමයක් අනුව හෝ සහතිකයෙහි දක්වා ඇති නිශ්චය අනුව ගෙවීම කිරීමට යම් ණයකරුවකු අපොහොසත් වන අවස්ථාවක, ණය හිමියා විසින් එම සහතිකයේ සහතික පිටපතක්, එම ණයකරු පදිංචිව සිටින්නේ යම් අධිකරණ බලසීමාවක් තුළ ද එහි නිසි අධිකරණය වෙත ඉදිරිපත් කර එය ක්‍රියාවේ යොදවන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සහතිකයෙහි සහතික පිටපත, අවස්ථාවෝචිත පරිදි, දිසා අධිකරණය හෝ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ වහාම ඒ අධිකරණයෙහි දිසා විනිශ්චයකාර වරයා හෝ මහේස්ත්‍රාත්වරයා විසින් එම පිටපත ඒ අධිකරණයේ නඩු වාර්තාවෙහි අමුණා තැබීමට සැලැස්විය යුතු ය. එම සහතිකය එසේ අමුණා තබන ලද දිනයෙහි සිට එය ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ VI වන පරිච්ඡේදයෙහි තීන්දු ප්‍රකාශ

ක්‍රියාත්මක කිරීමට අදාළ වන විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ක්‍රියාත්මක කළ හැකි තාක් දුරට, නිත්‍ය ප්‍රකාශයක් ලෙස සලකනු ලබන එම සහතිකයට සහ ඊට සම්බන්ධව අදාළ විය යුතු ය.

7. මේ පනත යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් පහත සඳහන් බලතල සමගි මණ්ඩලයකට තිබිය යුතු ය :— සමගි මණ්ඩලයක බලතල.

(අ) සමගි මණ්ඩල පනතෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද, එක් ණයකරුවකුට වැඩියෙන් සිටින අවස්ථාවක, එම මණ්ඩලය සංස්ථාපනය කර ඇත්තේ යම් සමගි මණ්ඩල ප්‍රදේශයක් සඳහා ද ඉන් පිටත පදිංචි යම් ණයකරුවකු සම්බන්ධයෙන් එම ණය බේරුම් කිරීම හෝ නිශ්චය කිරීම ;

(ආ) පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන සාක්ෂිවලට අමතරව, සපයා ගැනීම හෝ විභාග කිරීම අවශ්‍ය යයි හෝ සුදුසු යයි මණ්ඩලය කල්පනා කරන වෙනත් ලිඛිත හෝ වාචික සාක්ෂි සියල්ල සපයා ගැනීම සහ ලබා ගැනීම ;

(ඇ) සාක්ෂි දීම සඳහා හෝ තමා සන්තකයේ තිබෙන යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම සඳහා මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණෙන ලෙස ශ්‍රී ලංකාවේ පදිංචි යම් තැනැත්තකු කැඳවීමට සහ සාක්ෂිකරුවකු හෝ ණයකරුවකු වශයෙන් ඔහු විභාග කිරීමට හෝ ඔහුගේ සන්තකයේ ඇති යම් ලේඛන යක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කිරීම ; සහ

(ඈ) සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සිවිල් නඩු කටයුත්තක දී පිළිගනු නොලැබිය හැකි යම් ලිඛිත හෝ වාචික සාක්ෂි පිළිගැනීම.

8. මේ පනත යටතේ කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් සමගි මණ්ඩල පනතේ 8, 9, 10 සහ 11 වන වගන්ති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය. සමගි මණ්ඩල පනතේ ඇතැම් විධි විධාන අදාළ කිරීම.

9. මේ පනත යටතේ කරන ලද ඉල්ලීමක් 3 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ බේරුම් කිරීම හෝ නිශ්චය කිරීම සඳහා සමගි මණ්ඩලයකට යොමු කරනු ලැබූ අවස්ථාවක, ඒ ඉල්ලීම අදාළ වන ණය අය කර ගැනීම හෝ බේරුම් කර ගැනීම සඳහා— සිවිල් නඩු යනාදිය වැළැක්වීම.

(අ) යම් අධිකරණයක නඩු පැවරීම හෝ යම් අධිකරණයක් විසින් නඩුවක් භාර ගැනීම හෝ නොකළ යුතු ය ;

(ආ) ණය සහනදායක මණ්ඩලය විසින් කිසිදු ඉල්ලීමක් භාර නොගත යුතු ය ; තව ද

(ඇ) සමගි කරන්නන්ගේ මණ්ඩලයක සභාපති විසින් සමගි මණ්ඩල පනතේ 6 වන වගන්තිය යටතේ කිසිදු ඉල්ලීමක් භාර නොගත යුතු ය.

නියෝග.

**10.** (1) මේ පනතෙහි ප්‍රතිපත්ති සහ විධිවිධාන බලගැන්වීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන කිසිම නියෝගයක්, ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබ එසේ අනුමත කරනු ලැබූ බවට දැන්වීමක් ගැසට් පත්‍රයෙහි සහ එක් දිනපතා පුවත් පත්‍රයක පළ කරනු ලබන තෙක් බල නොපැවැත්විය යුතු ය.

මේ පනත අනෙකුත් පනත් අභිබවා බල පැවැත්විය යුතු බව.

**11.** අන් කිසි නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**12.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි—

" අනුමත ණය දෙන ආයතනයක් " යන්නට උකස් පනතේ 3 වන වගන්තියේ ඊට දී ඇති අර්ථය ම ඇත;

" අනුමත අර්ථ සාධක අරමුදල " යන්නෙන් 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ කම්කරු කොම සාරිස් විසින් අනුමත කරන ලද අර්ථ සාධක අරමුදලක් විය යුතු යයි ප්‍රකාශිත අර්ථ සාධක අරමුදලක් අදහස් වේ;

" බැංකු ආයතනය " යන්නට මුදල් නීති පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත;

" පොත් ණය " යන්නට උකස් පනතේ 89 වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම ඇත;

" සමගි මණ්ඩලය " යන්නෙන් සමගි මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද සමගි මණ්ඩලයක් අදහස් වේ;

" සමගි මණ්ඩල පනත " යන්නෙන් 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත අදහස් වේ ;

' නිශ්චල දේපළක පොරොන්දු සිත්තක්කරය " යන්නට ණය සහනදායක ආඥාපනතේ 64 වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම ඇත ;

" ණය සහනදායක මණ්ඩලය " යන්නෙන් ණය සහනදායක ආඥා පනත යටතේ පිහිටුවන ලද ණය සහනදායක මණ්ඩලය අදහස් වේ;

' අමාත්‍යවරයා " යන්නෙන් අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

" නියමිත " යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබූ බව අදහස් වේ ;

" රාජ්‍ය සංස්ථාව " යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම් කිසි ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්ද වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් සපයනු ලබන්නා වූ මුළු ප්‍රාග්ධනය හෝ ඉන් කොටසක් හෝ ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ ආයතනයක් අදහස් වන්නේ ය.